


# අලියාන්ස්
# ආරෝග්‍ය

## නිරතුරුව ඔබ සුරකිමින්

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි පූර්ණ හිමිකාරීත්වය දරන උප සමාගමක් වේ.

155,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70 කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 126 කට පමණ සේවය සලසයි. 2022 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස නැවතත් පිදුම් ලද අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් ආරෝග්‍යා

ඔබගේ ජීවිතය ඔබට මෙන්ම ඔබගේ ආදරණීයයන්ටත් වටිනා බව අප දනිමු. ඒ නිසාම හදිසියේ ගොදුරු විය හැකි අසාධ්‍ය රෝගයකට මුහුණ දීමට අවශ්‍ය මූල්‍ය සවිය සලසන පරිපූර්ණ ආවරණයක් පැවතීම ඔබටත් ඔබේ පවුලටත් මහත් අස්වැසිල්ලක් වනු නොඅනුමානයි.

අසාධ්‍ය රෝග 26 කට මෙන්ම දරුණු තුවාල වීම් සඳහා අවධි 3 ක් යටතේ (සුළු සිට අසාධ්‍ය තත්ත්වය දක්වා) ඉහළ රැකවරණයක් සලසන ආරෝග්‍යා සැලසුම ඔබට සිතේ සැනසුම උදා කර දෙයි.

මෙමගින් ඔබට වැළඳුණු රෝගය බරපතළම අවධියට පත්වීමට ප්‍රථමයෙන්ම ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකාර ගැනීමට මුල්‍ය රැකවරණය සැලසෙයි.

## සුවය ලබාගැනීමේ ඔබේ උත්සාහයට සැනසිල්ලක්

## ප්‍රධාන අංග

- රෝගයේ බරපතළ කමේ ස්වභාවය අනුව, අවධි 3ක් යටතේ ප්‍රතිලාභ
- බරපතළම අවධිය සඳහා ප්‍රතිලාභ වටිනාකම මෙන් 150% ක් දක්වා මුදල්
- බරපතළම අවධියෙන් පසු වාරික ගෙවීම් වගකීමෙන් නිදහස්
- මරණයකදී මෙන්ම රෝහල්ගත කිරීමකදී පූර්ණ රැකවරණ
- ප්‍රතිලාභ
- කල්පිරීමේ වටිනාකමක්
- තෝරාගත හැකි - ළමා අසාධ්‍ය රෝග ආවරණය

  ආවරණය කෙරෙන අසාධ්‍ය රෝගයක් හේතුවෙන් රෝහල් ගත වූ විට දෛනික රෝහල් ආදායම් ප්‍රතිලාභයක්

## හිමිකම් පෑම් දෙකක් අතර කිසිඳු පොරොත්තු කාලයක් නැත

අලියාන්ස් ආරෝග්‍යා රක්ෂණය සමග විවිධ හිමිකම් පෑම් කිරීමේ අවස්ථාව සැලසේ. එකම රෝගයක්/තුවාල වීමක් ආශ්‍රිතව හෝ වෙනත් රෝග තත්ත්වයන්/තුවාල වීම් ආශ්‍රිතව හෝ විවිධ බරපතලතා අවධි යටතේ මෙසේ ඔබට හිමිකම් පෑම් අප වෙත ඉදිරිපත් කළ හැක.

මෙහි විශේෂත්වය වන්නේ, ඔබේ පළමු හිමිකම් ඉල්ලුම සහ දෙවන ඉල්ලුම අතර බලා සිටිය යුතු කිසිදු පොරොත්තු කාලයක් අදාළ නොවීමයි.

කෙසේ වෙතත් මරණ ප්‍රතිලාභය හෝ බරපතළම අවධිය යටතේ ප්‍රතිලාභයක් ගෙවීමෙන් පසු මෙම රක්ෂණය ක්ෂණිකව අවසන් වනු ඇත.



| රෝගය / එහි අවධිය | ගෙවීම් සීමාවන් | ආවරණය | |
|---|---|---|---|
| | | රෝග | තුවාල |
| ආසාධ්‍ය අවධිය | 150% ක ගෙවීමක් | පිළිකා, කොරෝනරි ආටරි බයිපාස් සැත්කම, හෘදයාබාධය, මල්ටිපල් ස්ක්ලෙරෝසිස්, හෘද කපාට සැත්කම්, අංශභාගය, කොමාව,මස්කියුලර් ඩිස්ට්‍රොෆි | අංශභාගය, කෝමාව, ආඝාතය |

| | | | |
|---|---|---|---|
| බරපතළ තත්ත්වය | 100% ක ගෙවීමක් | පිළිකා, කොරෝනරි ආටරි බයිපාස් සැත්කම, හෘදයාබාධය, මල්ටිපල් ස්ක්ලෙරෝසිස්, හෘද කපාට සැත්කම්, අංශභාගය, වකුගඩු අකර්මන්‍යතා, ප්‍රධාන අවයව බද්ධ කිරීම්, මාරාන්තික නොවන මොළයේ ගෙඩි, කාඩියෝමයෝපති, බැක්ටීරියල් මෙනින්ජයිටිස්, අපලික් සින්ඩ්‍රෝමය, ෆුල්මිනන්ට් වයිරල් හෙපටයිටීස් (උග්‍ර අක්මා අකර්මන්‍යතා), මෝටර් නියුරෝන් රෝගය, කෝමාව, සම්පූර්ණ අන්ධභාවය, අයෝටාවේ සැත්කම්, අවසාන අවධියේ අක්මා රෝගය, අවසාන අවධියේ පෙනහළු රෝගය, බිහිරිබව, කතාකිරීමේ හැකියාව අහිමිවීම, පුල්මොනරි ආටෙරියල් හයිපර්ටෙන්ෂන් | අංශභාගය, කෝමාව, සම්පූර්ණ අන්ධභාවය, තුන්වන ගනයේ පිළිස්සුම්, බරපතළ හිසේ ක්ෂතිය, බිහිරිබව, කතාකිරීමේ හැකියාව අහිමිවීම |
| සුළු රෝග අවධිය | 25% ක් දක්වා ගෙවීමක් (රු500,000 ක උපරිම මුදලකට යටත්ව) | පිළිකා, කොරෝනරි ආටරි බයිපාස් සැත්කම, හෘදයාබාධය, මල්ටිපල් ස්ක්ලෙරෝසිස්, ආඝාතය, හෘද කපාට සැත්කම්, වකුගඩු අකර්මන්‍යතා, ප්‍රධාන අවයව බද්ධ කිරීම්, අංශභාගය, කෝමාව | අංශභාගය, කෝමාව, ආඝාතය |

## වාරික අත්හැරීමේ ප්‍රතිලාභය (අසාධ්‍ය රෝගයක් වැලඳුණු පසු)

අසාධ්‍ය රෝගයක්, අසාධ්‍ය තත්ත්වයකට පත්ව ඇති බව රෝග නිර්ණය වූ විටෙක මෙම රක්ෂණය සඳහා නියමිත ඉදිරි වාරික ගෙවීමේ වගකීමෙන් ඔබව සම්පූර්ණයෙන් නිදහස් කෙරෙනු ඇත.

## ළමා අසාධ්‍ය රෝග ආවරණය

මෙම සැලසුම සමගින් ඔබේ එක් එක් දරුවාට වෙන් වෙන්ව අසාධ්‍ය රෝග ආවරණයන් සලසා ගත හැක. මෙහි ආවරණය වන රෝග පහත පරිදිය:

- පිළිකා (ප්‍රධාන ප්‍රතිලාභ පමණක්)
- බැක්ටීරියල් මෙනින්ජයිටීස්
- අංශභාගය (ප්‍රධාන ප්‍රතිලාභ පමණක්)
- තුන්වන ගනයේ පිලිස්සුම්
- ක්ෂත්තිය හිසේ තුවාළ

## කොන්දේසි

- ආවරණ වටිනාකම වනුයේ මූලික රක්ෂිතයාගේ ප්‍රතිලාභයෙන් 25% දක්වා වේ.
- මේ යටතේ මරණ ප්‍රතිලාභයක් හිමි නොවේ.
- රක්ෂණය කල් පිරිමේදී හෝ මූලික රක්ෂිතයාගේ මරණයකදී හෝ ප්‍රධාන අවධියකදී ප්‍රතිලාභ ගෙවීම් හේතු කොටගෙන ආවරණය අවසන් වීමේදී මෙම ආවරණයද අවසන් වනු ඇත.

## ඇතුලත්වීමේ සුදුසුකම්

| | |
|---|---|
| දරුවා | : අවම ඇතුලත්වීමේ වයස - මාස 3<br>උපරිම ආවරණ වයස - අවුරුදු 18 |
| මූලික රක්ෂිතයා | : අවම ඇතුලත්වීමේ වයස - අවුරුදු 18<br>උපරිම ආවරණ වයස - අවුරුදු 65 |
| රක්ෂිත මුදල | : අවම - රු 100,000<br>උපරිම - රු 5,000,000 |
| රක්ෂණ කාල සීමාව | : අවම - වසර 5<br>උපරිම - වසර 30 |

මෙය නිත්‍ය වාරික ගෙවිය යුතු රක්ෂණ සැලැස්මක් වන අතර මෙමගින් සලසන මූල්‍ය ප්‍රතිලාභ ඔබේ ජිවිතයේ මුහුණ දෙන අසාධ්‍ය රෝග ජය ගැනීමට අත්‍යවශ්‍ය සහය සලසයි.

Allianz

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493

25-27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ,
අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02.

දුරකථන : +94 112 300 400
විද්‍යුත් තැපෑල : customerservicelife@allianz.lk
වෙබ් අඩවිය : www.allianz.lk

**සැලකිය යුතුයි**

මෙහි එන ප්‍රතිලාභ සහ ආවරණයන් අලියාන්ස් ආරෝග්‍යා ඔප්පුව සම්බන්ධයෙන් වන සංක්ෂිප්තයක් පමණක් වන අතර සියලුම නියමයන්, කොන්දේසි සහ බැහැර කිරීම් අලියාන්ස් අරෝග්‍යා ඔප්පුව ප්‍රකාර වේ.